(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 17.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 මාර්තු 22 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** විදුලිබල අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෛයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරුෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, වැඩබලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණයේ දී අභියෝගයට ලක් කරන ලද 'අධිභාර බද්ද' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පතේ විධිවිධාන පිළිබඳව සමස්තයක් ලෙස සලකා බැලීමේදී, පනත් කෙටුම්පත හෝ පනත් කෙටුම්පතේ කිසිදු විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාව හෝ 13 ව්‍යවස්ථාව සමඟ අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිගමනය කරනු ලැබ ඇත.

මෙම තත්ත්වයන් තුළ එකී 'අධිභාර බද්ද' නමැති පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායකයේ සරල බහුතරයකින් වලංගු ලෙස සම්මත කරනු ලැබිය හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය වැඩිදුරටත් සඳහන් කරයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින සභාවේ වැඩකටයුතු පිළිබඳ නිල වාර්තාවේ මුද්‍රණය කරනු ලැබිය යුතු යැයි මම නියෝග කරමි."

II

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2022 මාර්තු 16 දින 'බුද්ධිමය දේපළ (සංශෝධන)' නමැති පනත් කෙටුම්පතෙහි ද; 2022 මාර්තු 19 දින 'පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත', 'කම්කරු වන්දි (සංශෝධන)' සහ 'ඉඩම් සංවර්ධන (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත්වල ද ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

III

" 'සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ)' නැමැති පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස 113(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට මතු පළ වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතිරේක සාමාජික මන්ත්‍රීවරයන් වශයෙන් ගරු කථානායකතුමා විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු. හේෂා විතානගේ මහතා

ගරු. වරුණ ලියනගේ මහතා

ගරු. කිංස් නෙල්සන් මහතා

ගරු. අනුප පස්කුවල් මහතා

ගරු. සුදත් මංජුල මහතා

ගරු. වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු. බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු. ලලිත් වර්ණ කුමාර මහතා"

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XXII කොටස; සහ

(ii) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XVI හා XVII කොටස්, පස්වැනි කාණ්ඩයේ I කොටස සහ හයවැනි කාණ්ඩයේ I හා II කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය සම්බන්ධ කාර්ය සාධන වාර්තාවේ - V කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XIV කොටස;

(ii) 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ XV කොටස;

(iii) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIII හා XXXIV කොටස්, තෙවැනි කාණ්ඩයේ XIV කොටස සහ නවවැනි කාණ්ඩයේ XXVI කොටස; සහ

(iv) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV, XXV හා XXVI කොටස්, තෙවැනි කාණ්ඩයේ XIV කොටස සහ නවවැනි කාණ්ඩයේ XI, XII, XIII හා XIV කොටස්

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(4) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දහවැනි කාණ්ඩයේ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ - I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(5) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ දේශීය වෙළඳපොළ තුළ ගුණාත්මක භාණ්ඩ අලෙවිය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කාර්යභාරය සම්බන්ධ කාර්ය සාධන විගණන වාර්තාවේ - IV කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී

(6) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2018 සහ 2019 වර්ෂ සඳහා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2020 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(11) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත කරන ලදී.

(12) මහාමාර්ග අමාත්‍යවරයා විසින් (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 122, 122අ වගන්ති සහ VIIඅ කොටස සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ඔක්තෝබර් 29 දිනැති අංක 2251/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා එම නියෝග ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත කරන ලදී.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද (464 වන අධිකාරය වූ) ඉඩම්

සංවර්ධන ආඥා පනත යටතේ නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) කටුවැල්ලගම, තොටිල්ලගහවත්ත, අංක 244/ඒ/01 දරන ස්ථානයෙහි පදිංචි ආර්. පී. තිලකරත්න මහතාගෙන් ලැබුණු 2022.01.20 දිනැති පෙත්සම ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) පිළියන්දල, මකුළුදූව, ප්‍රිය මාවත, අංක 53/10 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. එස්. එන්. පෙරේරා මහතාගෙන් සහ තවත් හත්දෙනෙකුගෙන් ලැබුණු 2021.12.01 දිනැති පෙත්සම ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(3) තම්පලාගාමම්, වර්ණමෙඩු යන ලිපිනයෙහි පදිංචි ටී. ෂන්මුගලින්ගම් මහතාගෙන් ලැබුණු 2021.12.15 දිනැති පෙත්සම ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) රක්වාන, මැදගංගොඩ යන ලිපිනයෙහි පදිංචි එම්.ජී. රෝෂන් ඉන්දික ගමගේ මහතාගෙන් ලැබුණු 2022.02.06 දිනැති පෙත්සම ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 මාර්තු 16 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙස නැවත නම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,—ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2021 මාර්තු 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තව දුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව, 2023 අප්‍රේල් 05 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීම.

පනත් කෙටුම්පත, සභාවේ අවසරය ඇතිව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**8. ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන):** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි විදේශ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

"ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය" යි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.30 ට ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.03 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි කම්කරු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.27 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.58 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 86; විරුද්ධව 35; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය දහසයදෙනෙක් (116) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 003. Nimal Siripala De Silva | Yes |
| G 004. Chamal Rajapaksa | Yes |
| G 005. Johnston Fernando | Yes |
| G 006. Dinesh Gunawardena | Yes |
| G 009. Basil Rohana Rajapaksa | Yes |
| G 010. G.L. Peiris | Yes |
| G 011. Pavithradevi Wanniarachchi | Yes |
| G 013. Gamini Lokuge | Yes |
| G 016. C. B. Rathnayake | Yes |
| G 017. Keheliya Rambukwella | Yes |
| G 020. Vasudeva Nanayakkara | Yes |
| G 023. Mahindananda Aluthgamage | Yes |
| G 024. Ramesh Pathirana | Yes |

| | |
|---|---|
| G 026. Rohitha Abeygunawardhana | Yes |
| G 027. Namal Rajapaksa | Yes |
| G 028. M.U.M. Ali Sabry | Yes |
| G 029. Sarath Weerasekera | Yes |
| G 032. Duminda Dissanayake | Yes |
| G 033. Dayasiri Jayasekara | Yes |
| G 034. Lasantha Alagiyawanna | Yes |
| G 035. Sudarshini Fernandopulle | Yes |
| G 039. Mohan Priyadarshana De Silva | Yes |
| G 044. Janaka Wakkumbura | Yes |
| G 049. Tharaka Balasuriya | Yes |
| G 050. Kanchana Wijesekera | Yes |
| G 051. Indika Anuruddha Herath | Yes |
| G 052. Siripala Gamalath | Yes |
| G 055. Thenuka Vidanagamage | Yes |
| G 056. D. V. Chanaka | Yes |
| G 057. Sisira Jayakody | Yes |
| G 059. Prasanna Ranaweera | Yes |
| G 060. D. B. Herath | Yes |
| G 061. Nalaka Godahewa | Yes |
| G 062. Channa Jayasumana | Yes |
| G 066. John Seneviratne | Yes |
| G 070. Tissa Vitharana | Yes |
| G 071. Dilan Perera | Yes |
| G 078. Rohana Dissanayaka | Yes |
| G 079. Premalal Jayasekara | Yes |
| G 083. K. Kader Masthan | Yes |
| G 084. Ashoka Priyantha | Yes |
| G 085. Jayantha Ketagoda | Yes |
| G 089. Amarakeerthi Athukorala | Yes |
| G 092. Thisakutti Arachchi | Yes |
| G 093. U. K. Sumith Udukumbura | Yes |
| G 094. Pradeep Undugoda | Yes |
| G 095. Sanjeeva Edirimanna | Yes |
| G 096. Akila Ellawala | Yes |
| G 098. Udayana Kirindigoda | Yes |
| G 104. Upul Galappaththi | Yes |
| G 105. Udayakantha Gunathilaka | Yes |

| | |
|---|---|
| G 106. Kokila Gunawardene | Yes |
| G 107. Sivanesathurai Santhirakanthan | Yes |
| G 108. Milan Jayathilake | Yes |
| G 109. Kulasingam Dhileeban | Yes |
| G 110. Premitha Bandara Tennakoon | Yes |
| G 112. Chamara Sampath Dasanayake | Yes |
| G 113. Sudarshana Denipitiya | Yes |
| G 114. Isuru Dodangoda | Yes |
| G 115. H. Nandasena | Yes |
| G 116. Sagara Kariyawasam | Yes |
| O 001. Rishad Bathiudeen | No |
| O 003. Imthiaz Bakeer Markar | No |
| O 004. Tissa Attanayake | No |
| O 005. Rauff Hakeem | No |
| O 007. Lakshman Kiriella | No |
| O 015. Selvam Adaikkalanathan | No |
| O 016. Anura Dissanayaka | No |
| O 017. G. G. Ponnambalam | No |
| O 018. Ali Sabri Raheem | Yes |
| O 023. Abdul Haleem | No |
| O 026. Harsha De Silva | No |
| O 029. Dilip Wedaarachchi | No |
| O 031. Eran Wickramaratne | No |
| O 033. Govindan Karunakaram | No |
| O 034. Dharmalingam Sithadthan | No |
| O 035. Vijitha Herath | No |
| O 036. Harini Amarasuriya | No |
| O 037. Selvarajah Kajendren | No |
| O 039. Sivagnanam Shritharan | No |
| O 040. M. A. Sumanthiran | No |
| O 044. Buddhika Pathirana | No |
| O 046. Nalin Bandara Jayamaha | No |
| O 049. Velu Kumar | No |
| O 052. K. Sujith Sanjaya Perera | No |
| O 054. Imran Maharoof | No |
| O 055. Mujibur Rahuman | No |
| O 058. Charles Nirmalanathan | No |
| O 060. Thavaraja Kalai Arasan | No |

| | |
|---|---|
| O 062. Chaminda Wijesiri | No |
| O 063. Hesha Withanage | No |
| O 064. Waruna Liyanage | No |
| O 065. M. Udayakumar | No |
| O 066. W. H. M. Dharmasena | No |
| O 068. Rohana Bandara | No |
| O 082. Gayashan Nawananda | Yes |
| O 084. Anupa Pasqual | Yes |
| O 086. Muditha Prishanthi | Yes |
| O 087. Uddika Premarathne | Yes |
| O 089. Sudath Manjula | Yes |
| O 090. Mayadunna Chinthaka Amal | Yes |
| O 091. Wasantha Yapabandara | Yes |
| O 093. B. Y. G. Rathnasekara | Yes |
| O 094. Kumarasiri Rathnayaka | Yes |
| O 095. Ajith Rajapakse | Yes |
| O 096. Gunathilaka Rajapaksha | Yes |
| O 097. Thilak Rajapakshe | Yes |
| O 098. Upul Mahendra Rajapaksha | Yes |
| O 103. Madhura Withanage | Yes |
| O 104. D. Weerasingha | Yes |
| O 106. Samanpriya Herath | Yes |
| O 108. Yadamini Gunawardena | Yes |
| O 109. Manjula Dissanayake | Yes |
| O 110. Ranjith Bandara | Yes |
| O 113. Charitha Herath | Yes |
| O 114. Marjan Faleel | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව වැඩබලන මහ ලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස්දෙනෙක් (05) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| S.B. Dissanayake | Yes |
| A.P. Jagath Pushpakumara | Yes |
| K.P.S. Kumarasiri | Yes |
| Hon. (Dr.) V. Radhakrishnan | No |
| Hon. Mano Ganesan | No |

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය සහ 2 වන වගන්තිය සභා සම්මත විය.

3 වන වගන්තිය

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 1 වන පිටුවේ 18 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''කොට්ඨාසයක් තුළ ද, 9 ආ වගන්තිය ප්‍රකාරව එම රඳවා තැබීමේ ස්ථානය බැලීමට යාම සඳහා එම මහෙස්ත්‍රාත්වරයා වෙත, ඒ නියමයේ සහතික කළ පිටපතක්, රඳවා තැබීමේ ස්ථානය භාර නිලධරයා විසින්, 9 වන වගන්තිය යටතේ නියමයක් නිකුත් කළ වහාම සහ කවර අවස්ථාවක දී වුව ද, එම නියමය නිකුත් කරනු ලැබූ වේලාවේ සිට පැය හතළිස් අටක් නොඉක්මවීමට පෙර ලැබීමට'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වන පිටුවේ 30 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) එම සැකකරු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා අධිකරණ වෛද්‍ය නිලධරයකු වෙත ඉදිරිපත් කරන ලෙසට සහ එම වෛද්‍ය නිලධරයා විසින් මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට විධාන කිරීම; සහ

(ආ) සැකකරුගේ රඳවා තැබීමේ ස්ථානය වෙනස් කරන ලෙසට ආඥාවක් කිරීම,

කරනු ලැබිය හැකි ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වන පිටුවේ 1 වන සහ 2 වන පේළි ඉවත් කරන්න.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වන පිටුවේ 14 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''යුතු ය.''.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වන වගන්තිය

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වන පිටුවේ 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වන වගන්තිය සභා සම්මත විය.

6 වන වගන්තිය

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වන පිටුවේ 29 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''වන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) ඒ තැනැත්තාට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා උචිත ආඥාවක් කිරීම; සහ

(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් එම තැනැත්තාට භාර දෙනු ලබන අවස්ථාවේ, ඒ තැනැත්තා සම්බන්ධයෙන් වන රඳවා තබා ගැනීමේ නියමයක් ද බලාත්මක පවතී නම්, එම තැනැත්තාගේ රඳවා තැබීමේ ස්ථානය වෙනස් කරන ලෙස ආඥාවක් කිරීම,

කරනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පොලිස්පතිවරයා වෙත විධාන කිරීම ද කරනු ලැබිය යුතු ය.''.;

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 5 වන පිටුවේ 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන ව්‍යවස්ථාව යටතේ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

7 වන වගන්තියේ සිට 9 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

10 වන වගන්තිය

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 6 වන පිටුවේ 11 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“එසේ වුව ද, මහාධිකරණය විසින්, සුවිශේෂී අවස්ථානුගත තත්ත්වයන්හි දී, 15 වන වගන්තියේ (2) උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මහාධිකරණය විසින් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, සැකකරු ඇප මත නිදහස් කරනු ලැබිය හැකි ය.”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11 වන වගන්තිය සභා සම්මත විය.

12 වන වගන්තිය

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 7 වන පිටුවේ 10 වන පේළිය සහ 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව, 140 වන ව්‍යවස්ථාව හෝ 141 වන ව්‍යවස්ථාව යටතේ නීති කෘත්‍යයක දී ප්‍රශ්න”;

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

විදේශ කටයුතු අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 7 වන පිටුවේ 15 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

“දෙන ලද යම් විධානයක් අනුව සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් යම්”.

“සංශෝධනය පිළිගත යුතු ය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

“වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

13 වන වගන්තිය සහ 14 වන වගන්තිය සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

“ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය”, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය"යි විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**9. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.10 ට නියෝජ්‍ය කථානායකවරයා විසින් 2022 මාර්තු 23 බදාදා පූ.භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.